# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk


ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2021.01.15 |

# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2020 නොවැම්බර්

## සුවිශේෂ සිදුවීම්

| | 2020 නොවැම්බර් | 2020 ජනවාරි - නොවැම්බර් |
|---|---|---|
| වෙළඳ හිඟය | එ.ජ.ඩො. මිලියන 565<br>2019 නොවැ. එ.ජ.ඩො. මිලියන 762 | එ.ජ.ඩො. මිලියන 5,416<br>2019 ජන. - නොවැ. එ.ජ.ඩො. මිලියන 7,213 |
| වෙළඳ භාණ්ඩ අපනයන | එ.ජ.ඩො. මිලියන 819<br>2019 නොවැ. එ.ජ.ඩො. මිලියන 979<br>-16.3% වාර්ෂික ලක්ෂ්‍යමය | එ.ජ.ඩො. මිලියන 9,113<br>2019 ජන. - නොවැ. එ.ජ.ඩො. මිලියන 10,940<br>-16.7% වාර්ෂික ලක්ෂ්‍යමය |
| වෙළඳ භාණ්ඩ ආනයන | එ.ජ.ඩො. මිලියන 1,384<br>2019 නොවැ. එ.ජ.ඩො. මිලියන 1,741<br>-20.5% වාර්ෂික ලක්ෂ්‍යමය | එ.ජ.ඩො. මිලියන 14,529<br>2019 ජන. - නොවැ. එ.ජ.ඩො. මිලියන 18,153<br>-20.0% වාර්ෂික ලක්ෂ්‍යමය |

**සංචාරක ඉපැයීම්**

2020 නොවැ. : -

2020 ජන-නොවැ: එ.ජ.ඩො. මිලියන 956 (-69.7% වාර්ෂික ලක්ෂ්‍යමය)

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**

2020 නොවැ. : එ.ජ.ඩො. මිලියන 612 (18.7% වාර්ෂික ලක්ෂ්‍යමය)

2020 ජන-නොවැ: එ.ජ.ඩො. මිලියන 6,291 (3.9% වාර්ෂික ලක්ෂ්‍යමය)

---

**කොළඹ කොටස් වෙළඳපොළ (ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ-ශුද්ධ)**

2020 නොවැ.: එ.ජ.ඩො. මිලියන -15

2020 ජන. - නොවැ.: එ.ජ.ඩො. මිලියන -209




**රාජ්‍ය සුරැකුම්පත් (ශුද්ධ)**

2020 නොවැ.: එ.ජ.ඩො. මිලියන -11

2020 ජන. - නොවැ.: එ.ජ.ඩො. මිලියන -543




**දළ නිල සංචිත**

2020 නොවැ. අග: එ.ජ.ඩො. බිලියන 5.6 (ආනයනික මාස 4.1)




**විනිමය අනුපාතිකය (එ.ජ ඩොලරයට රුපියල්)**

2019 දෙසැ. අග: 181.6340

2020 නොවැ. අග: 184.9601




ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

## සමස්ත නිරීක්ෂණ

අපනයන ඉපැයීම් පහත වැටීම හමුවේ වුව ද, 2020 වසරේ නොවැම්බර් මාසයේ දී අඩු වෙළඳ හිඟයක් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල සැලකිය යුතු වැඩි වීමක් ද ඇතුළුව විදේශීය අංශයේ ධනාත්මක ප්‍රවණතා ගණනාවක් දක්නට ලැබිණි. අත්‍යවශ්‍ය නොවන ආනයන සඳහා වන සීමාවන් අඛණ්ඩව පවත්වා ගෙන යෑම සහ ගෝලීය වෙළඳපොළෙහි තෙල් මිල ගණන් අඩු මට්ටමක පැවතීම හේතුවෙන් භාණ්ඩ ආනයන අඛණ්ඩව පහත වැටුණි. කොවිඩ්-19 වසංගතයේ දෙවන රැල්ලත් සමඟ දේශීය නිෂ්පාදන ක්‍රියාවලියට ඇති වූ බාධා හේතුවෙන් පෙර මාසවලට සාපේක්ෂව නොවැම්බර් මාසයේ දී භාණ්ඩ අපනයනයේ සැලකිය යුතු අඩුවීමක් සිදු විය. විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ නොවැම්බර් මාසයේ දී ද අඛණ්ඩ වර්ධනයක් වාර්තා කළේය. මූල්‍ය ගිණුම සැලකීමේ දී, 2020 වසරේ නොවැම්බර් මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි සහ කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන සුළු ශුද්ධ ගෙවීම් වාර්තා කළේය. 2020 වසරේ නොවැම්බර් මස අවසන් වන විට දළ නිල සංචිත මට්ටම එ.ජ. ඩොලර් බිලියන 5.6ක් වූ අතර, 2020 වසරේ නොවැම්බර් මාසය තුළ ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සුළු වශයෙන් අවප්‍රමාණය විය.

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2019 නොවැ. එ.ජ.ඩො. මිලියන | 2020 නොවැ. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2019 ජන.- නොවැ. එ.ජ.ඩො. මිලියන | 2020 ජන.- නොවැ. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 979 | 819 | -16.3 | 10,940 | 9,113 | -16.7 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,741 | 1,384 | -20.5 | 18,153 | 14,529 | -20.0 |
| වෙළඳ ශේෂය | -762 | -565 | | -7,213 | -5,416 | |
| සංචාරක ඉපැයීම් | 334 (ආ) | - | - | 3,151 (ආ) | 956 (ඇ) | -69.7 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 515 | 612 | 18.7 | 6,052 | 6,291 | 3.9 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -36 | -15 | | -30 | -209 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 191 | 87 | | 6,457 | 1,899 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර (දළ) | 69 | 1 | | 580 | 103 | |
| දිගුකාලීන ණය (දළ) | 121 | 86 | | 1,477 | 1,795 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (දළ) | - | - | | 4,400 | - | |
| විදේශ සෘජු ආයෝජන (දළ) (ඉ) | | | | 793 | 548 | |
| සමස්ත ශේෂය | | | | 488 | -2,203 | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.

(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.

(ඈ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත් වේ.

(ඉ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස නවය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ.

## වෙළඳ ශේෂය සහ වෙළඳ මිල අනුපාතය

**වෙළඳ හිඟය 2019 වසරේ නොවැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 762 සිට 2020 වසරේ නොවැම්බර් මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 565 ක් දක්වා එ.ජ.ඩොලර් මිලියන 198කින් අඩු විය**. මාසය තුළ අපනයන ආදායම පහත වැටීම අභිබවා ආනයන වියදම විශාල වශයෙන් පහත වැටීම මේ සඳහා හේතු විය.

තවද, 2020 වසරේ ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී සමස්ත වෙළඳ හිඟය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 7,213ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 5,416ක් දක්වා අඩු විය. මෙම කාලපරිච්ඡේදය තුළ දී වෙළඳ හිඟය අඩු වීම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූපසටහන 01 මගින් දැක්වේ.

අපනයන හා ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය, 2019 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව 2020 වසරේ නොවැම්බර් මාසයේ දී සියයට 0.6කින් ඉහළ ගිය අතර, මේ සඳහා අපනයන මිල ගණන් පහත වැටීම අභිබවා ආනයන මිල ගණන් පහත වැටීම හේතු විය.

**රූප සටහන 1: 2020 වසරේ ජනවාරි - නොවැම්බර් කාලපරිච්ඡේදය තුළ වෙළඳ හිඟය අඩු වීම සඳහා දායක වූ ප්‍රධාන අයිතම (එ.ජ. ඩො. මිලියන)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2019 -2020)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2019 -2020)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

**සමස්ත අපනයන: ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල කොවිඩ්-19 වසංගත තත්ත්වය නැවත ව්‍යාප්ත වීම හේතුවෙන් 2020 වසරේ නොවැම්බර් මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ඉපැයීම් දුර්වල විය.** 2020 වසරේ නොවැම්බර් මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම 2019 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 819ක් දක්වා සියයට 16.3කින් පහත වැටුණි. මෙය 2020 වසරේ ඔක්තෝබර් මාසයට සාපේක්ෂව සියයට 3.4ක පහත වැටීමකි. මේ සඳහා වසංගතයේ දෙවැනි රැල්ලේ බලපෑම අවම කිරීම සඳහා රට තුළ පනවන ලද ක්‍රියාමාර්ග හේතුවෙන් විශේෂයෙන් ඇඟලුම් අතුළු ප්‍රධාන අපනයන අංශවල නිෂ්පාදන ක්‍රියාකාරකම්වලට බලපෑම් ඇති විය. තවද, වසංගතයේ දෙවන රැල්ල අපනයන ඉල්ලුම සඳහා අහිතකර ලෙස බලපා ඇති අතර, ගෝලීය නාවික හා සැපයුම් දාමයන්ට සැලකිය යුතු බාධා ඇතිවීම ද දේශීය ව්‍යාපාරවලට අහිතකර ලෙස බලපා ඇත.

**කාර්මික අපනයන:** 2019 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව 2020 වසරේ නොවැම්බර් මාසයේ දී කාර්මික අපනයන ආදායම සියයට 19.6කින් පහත වැටුණු අතර, මේ සඳහා ඇඟලුම් අපනයන ආදායම සියයට 37.2කින් පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු විය. කර්මාන්තශාලාවල සෞඛ්‍යමය සීමාවන් පැනවීම ඇඟලුම් අපනයන ආදායම පහත වැටීම සඳහා සැලකිය යුතු ලෙස දායක වී ඇත. මේ අතර, නැව් සඳහා භාවිත කරන ඉන්ධනවල අපනයන පරිමා සහ මිල ගණන් පහත වැටීම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම කැපී පෙනෙන ලෙස පහත වැටුණි. මේ අතර, කුඩා කර්මාන්ත ශාලා පදනම් කරගත් අංශ ගණනාවක ද අපනයන අඩු වුවත්, ඇතැම් කාර්මික අපනයන කාණ්ඩවල අපනයන ආදායම ඉහළ ගියේය. එසේ අපනයන ආදායම ඉහළ ගිය ගණයට මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ; රබර් නිෂ්පාදිත (ටයර් සහ අත්වැසුම් අපනයන ඉහළ යෑම හේතුවෙන්); සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (ප්ලාස්ටික් ඇඳුම් උපාංග වැනි පෞද්ගලික සනීපාරක්ෂක උපකරණ අපනයන ඉහළ යෑම හේතුවෙන්) ඇතුළත් වේ.

**කෘෂිකාර්මික අපනයන:** 2019 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව 2020 වසරේ නොවැම්බර් මාසයේ දී කෘෂිකාර්මික අපනයන ආදායම සියයට 2.3කින් පහත වැටුණු අතර, මේ සඳහා මුහුදු ආහාර,

සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත (පලතුරු, ආහාරයට ගත හැකි ඇට වර්ග, බුලත් ආදිය) සහ තේ අපනයන පහත වැටීම හේතු විය. තේ අපනයන ආදායම සියයට 5.2කින් පහත වැටුණු අතර, මේ සඳහා කළු තේ සහ හරිත තේ අපනයන පරිමා අඩුවීම හේතු විය. නමුත් මෙම වර්ග දෙකෙහි ම අපනයන ඒකක මිල ගණන් සුළු වශයෙන් ඉහළ ගියේය. අපනයන ආදායමේ වර්ධනයන් සටහන් කළ කෘෂිකාර්මික අපනයන වනුයේ, කුළුබඩු (ප්‍රධාන වශයෙන් කුරුඳු සහ ගම්මිරිස්), පොල් (ප්‍රධාන වශයෙන් පොල්තෙල් සහ පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත) සහ රබර් ය.

**ඛනිජ අපනයන:** 2019 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව 2020 වසරේ නොවැම්බර් මාසයේ දී ඛනිජ අපනයන ආදායම සියයට 4.4කින් පහත වැටුණි. පාෂාණ හා ගල් වර්ග අපනයන ආදායම පහත වැටුණු අතර, ලෝපස්, ලෝබොර හා අළු අපනයන ආදායම ඉහළ ගියේය.

**අපනයන දර්ශක:** 2020 වසරේ නොවැම්බර් මාසයේ දී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව අපනයන පරිමා දර්ශකය සියයට 7.9කින් සහ අපනයන ඒකක මිල දර්ශකය සියයට 9.1කින් පහත වැටුණි. අපනයන ආදායම පහත වැටීම සඳහා අපනයන පරිමා සහ මිල ගණන් යන සාධක දෙකම පහත වැටීම හේතු වූ බව මෙමගින් පිළිබිඹු වේ.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: මාසික අපනයන පරිමා දර්ශකය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)

| කාණ්ඩය | නොවැ. 2019 (එ.ජ.ඩො. මිලියන) | නොවැ. 2020 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- නොවැ. 2019 (එ.ජ.ඩො. මිලියන) | ජන.- නොවැ. 2020 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **787.6** | **632.9** | **-19.6** | **8,627.4** | **6,946.1** | **-19.5** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 34.9 | 35.0 | 0.3 | 410.9 | 422.7 | 2.9 |
| සත්ත්ව ආහාර | 8.3 | 6.5 | -21.4 | 117.4 | 95.1 | -19.0 |
| රෙදිපිළි හා ඇඟලුම් | 484.8 | 326.2 | -32.7 | 5,113.2 | 3,971.3 | -22.3 |
| එයින්, ඇඟලුම් | 448.1 | 281.4 | -37.2 | 4,753.7 | 3,526.7 | -25.8 |
| රෙදිපිළි | 25.7 | 26.1 | 1.8 | 261.5 | 234.0 | -10.5 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 11.1 | 18.8 | 69.2 | 98.1 | 210.5 | 114.6 |
| රබර් නිෂ්පාදිත | 60.6 | 66.4 | 9.5 | 793.1 | 711.2 | -10.3 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 26.9 | 59.1 | 120.1 | 281.4 | 192.4 | -31.6 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 28.9 | 31.9 | 10.4 | 370.3 | 298.0 | -19.5 |
| ප්‍රවාහන උපකරණ | 4.5 | 5.9 | 31.6 | 139.7 | 64.6 | -53.8 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 56.5 | 21.3 | -62.4 | 465.8 | 342.4 | -26.5 |
| රසායනික නිෂ්පාදිත | 14.8 | 16.3 | 10.0 | 163.5 | 156.0 | -4.6 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 8.4 | 7.1 | -16.1 | 120.1 | 89.6 | -25.4 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 6.0 | 4.5 | -24.6 | 44.5 | 43.4 | -2.6 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 6.2 | 2.5 | -59.7 | 95.4 | 49.5 | -48.1 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.4 | 21.1 | 228.6 | 67.7 | 170.3 | 151.5 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 14.5 | 8.4 | -41.8 | 163.1 | 98.8 | -39.4 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 2.7 | 2.6 | -4.6 | 27.7 | 20.8 | -24.8 |
| වෙනත් කාර්මික අපනයන | 23.2 | 18.1 | -21.9 | 253.5 | 220.2 | -13.1 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **187.3** | **183.1** | **-2.3** | **2,266.5** | **2,132.9** | **-5.9** |
| තේ | 101.5 | 96.2 | -5.2 | 1,240.6 | 1,128.0 | -9.1 |
| රබර් | 1.1 | 3.2 | 180.0 | 22.4 | 25.5 | 13.8 |
| පොල් | 22.9 | 28.6 | 24.9 | 307.7 | 318.4 | 3.5 |
| කුළුබඩු | 24.1 | 33.8 | 40.1 | 291.5 | 300.4 | 3.1 |
| එළවළු | 2.3 | 2.0 | -10.9 | 29.2 | 34.9 | 19.4 |
| සකස් නොකළ දුම්කොළ | 3.1 | 1.3 | -59.7 | 31.1 | 23.0 | -26.1 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 13.3 | 7.6 | -43.3 | 105.5 | 127.3 | 20.7 |
| මුහුදු ආහාර | 19.0 | 10.5 | -44.9 | 238.6 | 175.4 | -26.5 |
| **3. ඛනිජ අපනයන** | **2.4** | **2.3** | **-4.4** | **30.6** | **20.5** | **-33.1** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.4** | **0.9** | **-37.0** | **15.6** | **13.1** | **-15.9** |
| **මුළු අපනයන** | **978.8** | **819.2** | **-16.3** | **10,940.1** | **9,112.6** | **-16.7** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

**සමස්ත ආනයන: 2020 වසරේ මාර්තු මාසයේ සිට දක්නට ලැබුණු පරිදි පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ආනයන වියදම පහත වැටීමේ ප්‍රවණතාවය තවදුරටත් පවත්වා ගනිමින් 2020 වසරේ නොවැම්බර් මාසයේ දී ද වෙළඳ භාණ්ඩ ආනයන වියදම පහත වැටුණු අතර**, **මේ සඳහා, බොරතෙල් මිල ගණන් සාපේක්ෂ වශයෙන් පහත මට්ටමක පැවතීම සහ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයන මත රජය මගින් පැනවූ සීමා ප්‍රධාන වශයෙන් හේතු විය**. 2019 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව 2020 වසරේ නොවැම්බර් මාසයේ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,384ක් දක්වා සියයට 20.5කින් පහත වැටුණි. පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ යන ප්‍රධාන ආනයන කාණ්ඩ තුනෙහිම ආනයන වියදම අඩුවීම මේ සඳහා හේතු විය.

**පාරිභෝගික භාණ්ඩ :** 2019 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව 2020 වසරේ නොවැම්බර් මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 31.0කින් පහත වැටුණු අතර, පෞද්ගලික රථවාහන ආනයනය සඳහා පැනවූ සීමා මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත සහ සනීපාරක්ෂක උපකරණ යන කාණ්ඩ හැර ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ යටතේ වර්ග කර ඇති වෙනත් ප්‍රධාන කාණ්ඩවල ආනයන, 2019 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව පහත වැටුණි. කෙසේ වුවද, ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ කාණ්ඩ යටතේ වර්ග කර ඇති ඇතැම් අහඹු අයිතම සමහරක් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ද ඉහළ ගියේය. සිගරට්, ඇතැම් ඇඳුම් අයිතම, ටිෂූ කඩදාසි, පාපිසි, මෙට්ට, ශීතකරණ, විදුලි පංකා, ඔරලෝසු, ලාම්පු, ටීවී ඇන්ටනා, ඇතැම් පාවහන් වර්ග, රේසර්, කුඩ සහ ඇතැම් විලවුන් වර්ග ඒ අතර වේ. එම අයිතම ආනයනය ඉහළ යෑම මගින් වෙළඳ ශේෂයට සැලකිය යුතු පීඩනයක් ඇති වී නොමැත. මේ අතරින් සමහර අයිතම ආනයන සීමාවලට යටත් නොවේ. 2019 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව 2020 වසරේ නොවැම්බර් මාසයේ දී ආහාර හා පාන වර්ග ආනයන වියදම සියයට 11.4කින් පහත වැටුණු අතර, මේ සඳහා බොහෝ ආහාර හා පාන වර්ග ආනයන පහත වැටීම හේතු විය. කෙසේ වුවද, පරිප්පු, තෙල් හා මේද වර්ග (ප්‍රධාන වශයෙන් පොල් තෙල්) සහ කොත්තමල්ලි ඇට ආනයන ඉහළ ගියේය.

**අන්තර් භාණ්ඩ:** 2019 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව 2020 වසරේ නොවැම්බර් මාසයේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම සියයට 17.6කින් පහත වැටුණු අතර, ලෝක වෙළඳපොළෙහි තෙල් මිල ගණන් අඩුවීම හේතුවෙන් ඉන්ධන ආනයන වියදම සියයට 44.0කින් පහත වැටීම මේ සඳහා හේතු විය. බොරතෙල් බැරලයක් සඳහා ආනයන මිලෙහි සාමාන්‍යය 2019 වසරේ නොවැම්බර් මාසයේ දී දක්නට ලැබුණු එ.ජ.ඩොලර් 69.11ට සාපේක්ෂව 2020 වසරේ නොවැම්බර් මාසයේ දී එ.ජ.ඩොලර් 45.88ක් විය. 2019 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව 2020 වසරේ නොවැම්බර් මාසයේ දී බොරතෙල් ආනයන පරිමාව සුළු වශයෙන් ඉහළ ගිය අතර, පිරිපහදු කළ ඛනිජ තෙල් සහ ගල් අඟුරු ආනයන පරිමා පහත වැටුණි. කැපී පෙනෙන අඩු වීමක් වාර්තා කළ වෙනත් අන්තර් භාණ්ඩ කාණ්ඩ වනුයේ ඇඟලුම් නිෂ්පාදනය සඳහා භාවිත කරනු ලබන රෙදිපිළි හා රෙදිපිළි උපාංග, සිමෙන්ති ක්ලින්කර සහ තිරිඟු ආනයන වේ. පොහොර, රසායනික නිෂ්පාදිත, යකඩ හා වානේ සහ දියමන්ති ආනයන කැපී පෙනෙන ලෙස වර්ධනය වූ අන්තර් භාණ්ඩ අතරට ඇතුළත් වේ.

**ආයෝජන භාණ්ඩ:** 2019 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව 2020 වසරේ නොවැම්බර් මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම සියයට 18.1කින් පහත වැටුණු අතර, යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ යන ප්‍රධාන කාණ්ඩ තුනෙහි සහ ඒවායේ බොහෝ උප කාණ්ඩවල ආනයන වියදම පහත වැටීම මේ සඳහා හේතුවිය. මේ සඳහා ආනයන සීමා කිරීම් යම්තාක් දුරට බලපා ඇත. ආනයන වියදමේ විශාල අඩුවීමක් පෙන්නුම් කළ ආනයන අයිතම වනුයේ, යකඩ හා වානේ උපාංග, වෛද්‍ය හා රසායනාගාර උපකරණ, වාණිජ අරමුණු සඳහා භාවිත කරනු ලබන රථවාහන, සිමෙන්ති, පිඟන් මැටි නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ කොටස් සහ වර්ග නොකළ කාර්මික උපකරණ සහ ප්‍රවාහන උපකරණයි. කෙසේ වුවද, යකඩ හා වානේ, පරිගණක, සම්ප්‍රේෂණ උපකරණ, කෘෂිකාර්මික යන්ත්‍රසූත්‍ර සහ ට්‍රැක්ටර් ආනයන වියදම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය.

**ආනයන දර්ශක**: 2020 වසරේ නොවැම්බර් මාසයේ දී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ආනයන පරිමා දර්ශකය සියයට 12.0කින් සහ ආනයන මිල දර්ශකය සියයට 9.7කින් පහත වැටුණි. මෙමගින් ආනයන වියදම පහත වැටීම සඳහා ආනයන පරිමා සහ මිල ගණන් යන සාධක දෙකම පහත වැටීම හේතු වූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 6: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: මාසික ආනයන පරිමා දර්ශකය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | නොවැ. 2019 (එ.ජ.ඩො. මිලියන) | නොවැ. 2020 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- නොවැ. 2019 (එ.ජ.ඩො. මිලියන) | ජන.- නොවැ. 2020 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **370.4** | **255.5** | **-31.0** | **3,565.7** | **3,073.9** | **-13.8** |
| ආහාර හා පාන වර්ග | 140.7 | 124.6 | -11.4 | 1,278.9 | 1,396.3 | 9.2 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 3.3 | 2.7 | -17.3 | 32.1 | 30.1 | -6.2 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 31.6 | 29.4 | -6.9 | 282.0 | 302.7 | 7.3 |
| එළවළු (ආ) | 32.2 | 33.2 | 3.0 | 269.5 | 313.3 | 16.3 |
| මුහුදු ආහාර | 20.3 | 10.7 | -47.3 | 199.3 | 175.6 | -11.9 |
| සීනි හා රසකැවිලි | 19.8 | 14.0 | -29.1 | 179.9 | 247.4 | 37.5 |
| කුළුබඩු | 12.1 | 9.3 | -22.9 | 102.2 | 115.3 | 12.9 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 21.5 | 25.2 | 17.5 | 213.9 | 211.9 | -1.0 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 229.7 | 130.9 | -43.0 | 2,286.8 | 1,677.6 | -26.6 |
| පෞද්ගලික රථවාහන | 80.7 | 0.5 | -99.4 | 731.7 | 282.4 | -61.4 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 44.4 | 46.9 | 5.7 | 498.0 | 540.5 | 8.5 |
| ගෘහ උපකරණ | 21.7 | 17.5 | -19.2 | 187.4 | 151.7 | -19.0 |
| රෙදිපිළි හා උපාංග | 20.5 | 16.5 | -19.8 | 251.1 | 182.3 | -27.4 |
| විදුලි සංදේශ උපකරණ | 26.2 | 20.4 | -22.2 | 225.6 | 231.1 | 2.5 |
| ගෘහ හා දැව භාණ්ඩ | 14.8 | 11.2 | -24.1 | 155.2 | 129.2 | -16.8 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 21.4 | 17.9 | -16.3 | 237.8 | 160.3 | -32.6 |
| **2. අන්තර් භාණ්ඩ** | **992.5** | **818.3** | **-17.6** | **10,413.2** | **8,211.6** | **-21.1** |
| ඉන්ධන | 319.6 | 178.9 | -44.0 | 3,558.4 | 2,307.5 | -35.2 |
| එයින්, බොරතෙල් | 96.1 | 65.7 | -31.6 | 920.4 | 544.9 | -40.8 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 202.2 | 98.1 | -51.5 | 2,447.5 | 1,579.3 | -35.5 |
| ගල්අඟුරු | 21.3 | 15.1 | -29.0 | 190.5 | 183.3 | -3.8 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 19.4 | 25.4 | 30.6 | 177.5 | 106.1 | -40.2 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 256.9 | 216.6 | -15.7 | 2,661.1 | 2,100.2 | -21.1 |
| කඩදාසි හා ඝන කඩදාසි | 37.0 | 34.4 | -7.2 | 419.7 | 346.5 | -17.5 |
| කෘෂිකාර්මික යෙදවුම් | 12.9 | 16.4 | 27.1 | 168.5 | 178.3 | 5.8 |
| තිරිඟු හා ඉරිඟු | 59.5 | 28.4 | -52.2 | 326.3 | 342.5 | 5.0 |
| මූල ලෝහ | 34.3 | 41.3 | 20.4 | 512.1 | 426.6 | -16.7 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 52.6 | 47.2 | -10.2 | 558.7 | 487.5 | -12.7 |
| රසායනික නිෂ්පාදිත | 66.2 | 79.5 | 20.1 | 764.4 | 749.4 | -2.0 |
| පොහොර | 9.1 | 67.0 | 635.1 | 204.0 | 228.5 | 12.0 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 21.3 | 15.7 | -26.3 | 220.7 | 198.4 | -10.1 |
| ඛනිජ නිෂ්පාදිත | 45.7 | 12.1 | -73.6 | 231.1 | 155.6 | -32.7 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 58.0 | 55.4 | -4.4 | 610.5 | 584.4 | -4.3 |
| **3. ආයෝජන භාණ්ඩ** | **377.8** | **309.4** | **-18.1** | **4,167.1** | **3,230.3** | **-22.5** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 216.2 | 200.1 | -7.4 | 2,251.1 | 1,964.9 | -12.7 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 114.5 | 78.7 | -31.3 | 1,391.7 | 930.9 | -33.1 |
| ප්‍රවාහන උපකරණ | 46.5 | 30.3 | -34.7 | 518.4 | 331.7 | -36.0 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.6 | 0.3 | -47.4 | 5.9 | 2.9 | -50.2 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.4** | **0.4** | **10.9** | **6.8** | **12.9** | **88.1** |
| **මුළු ආනයන** | **1,741.1** | **1,383.7** | **-20.5** | **18,152.9** | **14,528.7** | **-20.0** |
| **එයින් ඉන්ධන නොවන ආනයන** | **1,421.5** | **1,204.8** | **-15.2** | **14,594.5** | **12,221.2** | **-16.3** |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

**2020 වසරේ නොවැම්බර් මාසයේ දී අඛණ්ඩව අටවැනි මසටත් සංචාරක පැමිණීම් කිසිවක් වාර්තා නොවීය.** එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2020 වසරේ නොවැම්බර් මාසයෙන් අවසන් වූ මාස එකොළහ තුළ දී මුළු සංචාරක පැමිණීම් ප්‍රමාණය, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ 1,672,039ට සාපේක්ෂව 507,311ක මට්ටමක පැවතුණි. ඒ අනුව, සංචාරකයින්ගේ පැමිණීම මත පදනම්ව ඇස්තමේන්තු කෙරෙන සංචාරක ඉපැයීම් 2020 වසරේ නොවැම්බර් මාසය දක්වා කාලය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 956ක් වූ අතර, එය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 69.7ක අඩු වීමකි.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2020 වසරේ නොවැම්බර් මාසයේ දී සැලකිය යුතු වැඩි වීමක් වාර්තා කළේය.** 2020 වසරේ නොවැම්බර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 612ක් දක්වා සියයට 18.7කින් වර්ධනය විය. 2020 වසරේ ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුළ දී වාර්තා වූ මුළු විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 6,291ක් වූ අතර, එය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 3.9ක වර්ධනයකි.

**රූප සටහන 8: මාසික සංචාරක පැමිණීම්**




**මූලය**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**




**මූලයන්**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්

**රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන මාසය තුළ සුළු ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.** 2020 වසරේ නොවැම්බර් මාසයේ දී රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 11ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළ අතර, එමගින් 2020 වසරේ ජනවාරි සිට නොවැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී සමුච්චිත පදනම මත ශුද්ධ ගෙවීම්

එ.ජ. ඩොලර් මිලියන 543ක් දක්වා ඉහළ ගියේය. රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ආයෝජන ප්‍රමාණය 2020 වසරේ නොවැම්බර් මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 46ක අඩු මට්ටමක පැවතුණි.

2020 වසරේ නොවැම්බර් මාසයේ දී කොළඹ කොටස් වෙළඳපොළෙහි ද්විතීයික වෙළෙඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 15ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය. සමුච්චිත පදනම මත, 2020 වසරේ නොවැම්බර් මාසයෙන් අවසන් වූ මාස එකොළහ තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 209ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය.

මේ අතර, 2020 වසරේ නොවැම්බර් මාසයේ දී රජය වෙත වූ දිගු කාලීන ණය එ.ජ. ඩොලර් මිලියන 12ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.

## ජාත්‍යන්තර සංචිත

**2020 වසරේ නොවැම්බර් මස අවසාන වන විට පැවති දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 5.6ක් විය.** මෙම මට්ටම ආනයනික මාස 4.1කට සමාන විය. දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2020 වසරේ නොවැම්බර් මාසය අවසානයේ දී මාස 6.2ක ආනයන ආවරණය කිරීමට ප්‍රමාණවත් පරිදි එ.ජ. ඩොලර් බිලියන 8.4ක් විය.

**රූප සටහන 10: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

**මාසයේ මැද සිට උච්ඡාවචනය ඉහළ යෑමත් සමග, 2020 වසරේ නොවැම්බර් මාසය තුළ දී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සුළු අවප්‍රමාණය වීමක් වාර්තා කළේය.** වෙළඳපොළෙහි සමපේක්ෂණ හැසිරීම හේතුවෙන් දෙසැම්බර් මාසය තුළදී සැලකිය යුතු අවප්‍රමාණය වීමේ පීඩනයක් දක්නට ලැබුණි. සුදුසු පරිදි වෙළෙඳපොළ වෙත මැදිහත්වීම සහ ශිෂ්ට ප්‍රයෝග වැනි මහ බැංකුව විසින් ගනු ලැබූ කාලෝචිත ක්‍රියාමාර්ග හේතුවෙන් අවප්‍රමාණය වීමේ පීඩනය අඩු වූ අතර, එ.ජ. ඩොලරයට සාපේක්ෂව 2020 වසරේ රුපියලෙහි සමස්ත අවප්‍රමාණය සියයට 2.6කට සීමා විය. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් 2020 වසරේ දී ශ්‍රී ලංකා රුපියල, යුරෝ, ස්ටර්ලිං පවුම, ජපන් යෙන් සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය වූ අතර, ඉන්දියානු රුපියලට සාපේක්ෂව ස්ථාවරව පැවතුණි. මහ බැංකුව 2020 වසරේ නොවැම්බර් මාසයේ දී දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම අඛණ්ඩව සිදු කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, 2020 වසරේ නොවැම්බර් මාසය අවසානය දක්වා මහ බැංකුව විසින් ශුද්ධ පදනම මත අවශෝෂණය කර ගත් විදේශ විනිමය ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 305ක් විය.

**රූප සටහන 11: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2019 | 2020 | 2021 (ජන.13 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | +0.6% | -2.6% | -0.3% |
| යුරෝ | +2.6 % | -11.2% | +0.4% |
| ස්ටර්ලිං පවුම | -2.8% | -6.2% | -0.6% |
| ජපන් යෙන් | -1.0% | -7.5% | +0.1% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | +1.3% | -11.4% | -1.2% |
| ඉන්දියානු රුපියල | +2.6% | 0.0% | -0.3% |

**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව